SRI LANKA

## ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2022 ජනවාරි

## යෝජිත උත්තර

# (103) ආර්ථික විද්‍යාව (ECN)

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**
නො. 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.
දුරකථන: 011-2-559 669

මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2022 ජනවාරි

## (103) ආර්ථික විද්‍යාව

## යෝජිත උත්තර

(මුළු ලකුණු 40) **A කොටස**

***පළමුවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරː***

**1.1** (2)

**1.2** (1)

**1.3** (2)

**1.4** (2)

ඉල්ලුම් නම්‍යතාවය = 100% / 50%

= 0.5(එකට වඩා අඩු)

**1.5** (3)

**1.6** (1)

**1.7** (3)

**1.8** (2)

**1.9** (4)

**1.10** (2)

**1.11** දිගු කාලයේදී

**1.12** පහළ යනු ලැබේ

**1.13** අසත්‍ය

**1.14** සත්‍ය

**1.15** අසත්‍ය

**1.16** **ඉල්ලුම වක්‍රය දකුණට විතැන් වීමට බලපාන සාධක**

1) ආදේශන භාණ්ඩවල මිල වැඩිවීම.

2) අනුපූරක භාණ්ඩවල මිල අඩු වීම.

3) පාරිභෝගික ආදායම වැඩි වීම.

4) පාරිභෝගික රුචිය වැඩි වීම.

5) අනාගතයේදී මිල වැඩි වනු ඇතැයි අපේක්ෂා කිරීම.

6) පාරිභෝගිකයින් සංඛ්‍යාව (ගැනුම්කරුවන්) වැඩි වීම.

### 1.17 කතපයාධිකාරි වෙළෙඳපොළක ලක්ෂණ

1) සමස්ත වෙළෙඳපොළ තුළ ක්‍රියාත්මක වන්නේ සීමිත සැපයුම්කරුවන් සංඛ්‍යාවක් වීම.

2) ඇතුල්වීමේ/ පිටවීමේ බාධා පැවතීම.

3) කර්මාන්තයේ ආයතන අතර දැඩි අන්‍යෝන්‍ය බැඳියාවක් පැවැතීම.

4) කතපයාධිකාරි වෙළෙඳපොළක ආයතන සමජාතීය/සමාන හෝ විෂමජාතීය භාණ්ඩ නිපදවීම.

5) ආයතන මුහුණ දෙන ඉල්ලුම් වක්‍රය සාපෙක්ෂ වශයෙන් අනම්‍ය වූ පහළට බෑවුම් වන එකක් වීම.

### 1.18 ඉල්ලුම වෙනස් වීම

සලකා බලන භාණ්ඩයේ මිල ස්ථාවරව තිබියදී ඉල්ලුම කෙරෙහි බලපාන අනෙකුත් සාධකයක වෙනස්වීම කරන කොටගෙන පැවති මිල යටතේම ඉල්ලුම ඉහළයාම හෝ ඉල්ලුම පහළයාම ඉල්ලුම වෙනස්වීම ලෙස හඳුන්වයි.මෙය සිදුවිය හැකි ආකාර දෙකක් තිබේ.

1 ඉල්ලුම අඩු වීම

2 ඉල්ලුම වැඩි වීම

සලකා බලන භාණ්ඩයේ මිල ස්ථාවරව තිබියදී ඉල්ලුම කෙරෙහි බලපාන අනෙකුත් සාධකයක් වෙනස්වීම නිසා පැවති මිල යටතේ ම ඉල්ලුම පහළගොස් ඉල්ලුම් වක්‍රය වමට විතැන් වීම ඉල්ලුම අඩු වීම ලෙස හැඳින්වේ. සලකා බලන භාණ්ඩයේ මිල ස්ථාවරව තිබියදී ඉල්ලුම කෙරෙහි බලපාන අනෙකුත් සාධකයක් වෙනස්වීම නිසා පැවති මිල යටතේම ඉල්ලුම ඉහළ ගොස් ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වීම ඉල්ලුම වැඩි වීම ලෙස හැඳින්වේ.

### 1.19 නිෂ්පාදන ක්‍රියාවලියේදී දිගුකාලීන නිෂ්පාදනය

aat SRI LANKA

දිගුකාලීන නිෂ්පාදනය යනු සමාගමකට ස්ථාවර සාධක යෙදවුම් විචල්‍ය යෙදවුම් බවට පරිවර්තනය කිරීමට අවශ්‍ය කාල සීමාව වන අතර දිගුකාලීනව නිෂ්පාදනය පුළුල් කිරීමට හෝ සංකෝචනය කිරීමට සමාගම්වලට වැඩි නම්‍යශීලී බවක් ඇත. නිෂ්පාදනයේදී භාවිත කරන සියලුම සාධක යෙදවුම් දිගු කාලීනව විචල්‍ය යෙදවුම් වන අතර ස්ථාවර සාධක යෙදවුම් නොමැත. එසේම සමාගම් විසින් දිගු කාලයේදී නිෂ්පාදන ධාරිතාව ප්‍රසාරණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස පරිමාණානුකූල පිරිමැසුම් ඇති කරයි.

### 1.20

1) ඉතිරිකිරීම්

2) ආනයනය

3) රජයේ බදු

***(එක් කොටසකට ලකුණු 02, මුළු ලකුණු 40)***

| **A කොටසෙහි අවසානය** |
|---|

*(මුළු ලකුණු 40 යි)* **B කොටස**

## *දෙවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

***පරිච්ඡේදය 01 - ව්‍යාපාර පරිසරයට අදාළ ආර්ථික සංකල්ප හා ආර්ථික පද්ධති***

**(a)**

1) සැපයුමේ සීමාවක් / හිඟයක් දක්නට නොලැබීම
2) සම්පත් පිරිවැයක් නොමැති වීම
3) අවස්ථික පිරිවැයක් නොපැවතීම
4) මිලක් නොපැවතීම
5) සොබාදහමේ දායාදයක් වීම
6) නිශ්චිත හිමිකමක් දක්නට නොලැබීම

*(ලකුණු 03)*

**(b)**

සැලසුම් කළ ආර්ථිකයක මූලික ආර්ථික ගැටලු මධ්‍යම සැලසුම් අධිකාරිය/ රජය විසින් විසඳනු ලබන්නේ සමාජ සුබසාධනය උපරිම කිරීම සඳහා සැලසුම් යාන්ත්‍රණය භාවිත කිරීමෙනි.

**කුමක් කොපමණ ප්‍රමාණයකින් නිපදවිය යුතුද?**

නිෂ්පාදනය කළ යුත්තේ කුමක් ද යන ප්‍රශ්නය යනු ආර්ථිකය විසින් නිෂ්පාදනය කළ යුතු භාණ්ඩ හා සේවා වල ප්‍රමාණයයි. එය විවිධ ආර්ථික ක්‍රියාකාරකම් අතර විකල්ප භාවිතයන් ඇති සම්පත් බෙදාහැරීමේ ගැටලුවකි.

සැලසුම්ගත ආර්ථික ක්‍රමය තුළ මෙම ගැටලුව සමාජ අවශ්‍යතා අනුව මධ්‍යම සැලසුම් මණ්ඩලයක් මගින් විසඳනු ලැබේ. සමාජ අවශ්‍යතා මත පදනම්ව මධ්‍යගත සැලසුම් මණ්ඩලය නිෂ්පාදනය කළ යුතු භාණ්ඩ මොනවාද සහ කුමන ප්‍රමාණයකින්ද යන්න තීරණය කරයි.

aat SRI LANKA

**කෙසේ නිපදවන්නේ ද?**

නිෂ්පාදනය කරන්නේ කෙසේද යන්නෙන් අදහස් කරන්නේ කුමන සාධක සංයෝජනය සහ ශිල්ප ක්‍රමය යොදා ගන්නේදැයි තීරණය කිරීමයි. භාණ්ඩයක් හෝ සේවාවක් සාමාන්‍යයෙන් විවිධ සාධක සංයෝජන සහ විවිධ ශිල්ප ක්‍රම සමගින් නිෂ්පාදනය කළ හැකි බැවින්, කුමන තාක්ෂණය භාවිත කරන්නේ ද යන ගැටලුව පැන නගී.

සැලසුම්ගත ආර්ථික ක්‍රමය තුළ, පවතින සම්පත් සහ නිෂ්පාදනයේ ස්වභාවය මත පදනම්ව මධ්‍යම සැලසුම් මණ්ඩලයක් මගින් මෙම ගැටලුව විසඳනු ලැබේ.

උදා - මධ්‍යම සැලසුම් මණ්ඩලය ප්‍රාග්ධන සුක්ෂම ශිල්ප ක්‍රමය හෝ ශ්‍රම සුක්ෂම ශිල්ප ක්‍රමය භාවිත කරන්නේද යන්න තීරණය කරයි.

**කා සඳහා නිපදවන්නේ ද ?**

කා සඳහා නිපදවන්නේ ද යන්නෙන් අදහස් කරන්නේ ආර්ථිකයේ ජාතික ආදායම සාධක හිමිකරුවන් අතර බෙදාහැරීම තීරණය කිරීමයි.

සැලසුම්ගත ආර්ථික ක්‍රමයේදී මෙම ගැටලුව විසඳනු ලබන්නේ මධ්‍යම සැලසුම් මණ්ඩලය මගිනි. මධ්‍යම සැලසුම් මණ්ඩලය විසින් සමාජ අවශ්‍යතා සැලකිල්ලට ගෙන පොදු සුබසාධනය උපරිම කිරීමේ පරමාර්ථයෙන් මෙම ප්‍රශ්නය විසඳනු ලැබේ.

*(ලකුණු 04)*

**(c) ශ්‍රමයේ ලක්ෂණ**

1) එය නිෂ්පාදනයේ සජීවී සම්පතක් වීම.

2) එය සමජාතීය නොවීම.

3) සංචලනය සඳහා සීමාවන් හෝ බාධක නොමැත.

4) පුහුණුව හා අධ්‍යාපනය තුළින් ඵලදායිතාව ඉහළ නැංවිය හැක.

5) ශ්‍රමයෙන් ලැබෙන ආදායම වැටුප් ලෙස හැඳින්වේ.

*(ලකුණු 03)*
*(මුළු ලකුණු 10 යි)*

## *තුන්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

*පරිච්ඡේදය 02 - ඉල්ලුම, සැපයුම, හා සමතුලිතය හා රජය මැදිහත් වන ආකාරය*


**(a)**

(i) $Qd = 160 - 10p$

$Qs = 30p$

| මිල (රු.) | ඉල්ලුම් ප්‍රමාණය (ඒකක) | සැපයුම් ප්‍රමාණය (ඒකක) |
|---|---|---|
| 0 | 160 | 0 |
| 4 | 120 | 120 |
| 8 | 80 | 240 |
| 12 | 40 | 360 |
| 16 | 0 | 480 |


SRI LANKA



**සමතුලිත මිල – රු. 4/-**
**සමතුලිත ප්‍රමාණය – ඒකක 120 කි**

**<u>විකල්ප පිළිතුර</u>**

| මිල (රු.) | ඉල්ලුම් ප්‍රමාණය (ඒකක) | සැපයුම් ප්‍රමාණය (ඒකක) |
|---|---|---|
| 0 | 160 | 0 |
| 1 | 150 | 30 |
| 2 | 140 | 60 |
| 3 | 130 | 90 |
| 4 | 120 | 120 |
| 5 | 110 | 150 |
| 6 | 100 | 180 |




*(ලකුණු 04)*

**(ii) නිෂ්පාදකයාගේ අතිරික්තය**

$$\text{නිෂ්පාදකයාගේ අතිරික්තය} = \frac{(\text{සමතුලිත මිල} - \text{අවම මිල}) \times \text{සමතුලිත ප්‍රමාණය}}{2}$$

$$= \frac{(4 - 0) \times 120}{2}$$

= රු. **240/-**

*(ලකුණු 02)*

**(b) භාණ්ඩයක් සඳහා ඒකක බද්දක් පැනවීමේ ප්‍රතිවිපාක**

භාණ්ඩයකට වක්‍ර බද්දක් ලෙස ඒකක බද්දක් පැනවූ විට එම භාණ්ඩයේ සැපයුම අඩු වී නිෂ්පාදන පිරිවැය ඉහළ යයි. වෙළෙඳපොළ සැපයුම් වක්‍රය බදු ප්‍රමාණය මත වමට විතැන් වන අතර එම නිසා සමතුලිත මිල වැඩි වීම හා සමතුලිත ප්‍රමාණය අඩු වීමක් දක්නට ලැබේ.

**වක්‍ර බදුවල ආර්ථික ප්‍රතිවිපාක**

1) වෙළෙඳපොළ සැපයුම අඩු වන අතර සැපයුම් වක්‍රය වමට විතැන් වේ.

2) සමතුලිත මිල වැඩි වන අතර සමතුලිත ප්‍රමාණය අඩු වේ.

3) බද්දට පෙර සහ පසු සැපයුම් වක්‍ර අතර සිරස් පරතරය බදු ප්‍රමාණයට සමාන වේ.


4) වක්‍ර බදු නිසා පාරිභෝගිකයන් වැඩිපුර ගෙවීමට සිදු වන අතර නිෂ්පාදකයන්ට ලැබෙන්නේ අඩු මුදලකි. එහි ප්‍රතිඵලයක් ලෙස පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදක අතිරික්තය අඩු වේ.

5) බදු බර පාරිභෝගිකයින් සහ නිෂ්පාදකයින් යන දෙපාර්ශ්වයටම දැරීමට සිදුවන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස දෙපාර්ශ්වයම අධෛර්යමත් වේ.

6) වක්‍ර බදු සමඟ රජයේ බදු ආදායම ඉහළ යනු ඇත.

7) පාරිභෝගිකයන් විවිධ මිල ගණන් යටතේ මිලදී ගැනීමට අදහස් කරන ප්‍රමාණයන්හි වෙනසක් නොමැති අතර බදු පැනවීමට පෙර සහ පසු, ඉල්ලුම් වක්‍රයේ පිහිටීමෙහි වෙනසක් නොමැත.

***වක්‍ර බදු පැනවීමේ ප්‍රතිවිපාක පහත පරිදි දැක්විය හැක.***




***(ලකුණු 04)***

***(මුළු ලකුණු 10 යි)***



aat SRI LANKA

## හතරවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

**පරිච්ඡේදය 05 - මූල්‍ය පද්ධතිය, මුදල් හා සාමාන්‍ය මිල මට්ටම**

### (a) උද්ධමනය පාලනය කිරීම සඳහා ගත හැකි විවිධ ක්‍රියාමාර්ග

1) නිෂ්පාදනය වැඩි කිරීමට නිෂ්පාදකයින් දිරිමත් කිරීම.

2 සමාහාර සැපයුමේ වර්ධනය වේගවත් කිරීම සඳහා උපාය මාර්ග අනුගමනය කිරීම.

3) සමාහාර ඉල්ලුමේ වර්ධනය සීමා කිරීමට/මන්දගාමී කිරීමට උපාය මාර්ග අනුගමනය කිරීම.

4) කාර්යක්ෂමව සම්පත් බෙදාහැරීමේහිලා පවතින බාධක ඉවත් කිරීම.

5) ණය පාලන යාන්ත්‍රණ හඳුන්වා දීම.

6) මිල පාලන යාන්ත්‍රණ හඳුන්වා දීම.

7) විනිමය අනුපාතිකය ස්ථාවර කිරීම සහ වෙළෙඳ හිඟය සහ ගෙවුම් ශේෂ හිඟය අවම කිරීම.

8) ආනයනය අවම කිරීම සහ අපනයන ආදායම වැඩි කිරීම.

9) ණය සඳහා ඇති ඉල්ලුම අඩු කිරීම සඳහා පොලී අනුපාතය/බැංකු පොලී අනුපාතය වැඩි කිරීම.

10) රජයේ අයවැය හිඟය අඩු කිරීම.

11) ණය ගැනීම් ප්‍රතිව්‍යුහගත කිරීම.

12) ඉතුරුම් දිරිමත් කිරීම සහ වැඩි කිරීම.

*(ලකුණු 03)*

### (b) විද්‍යුත් මුදල් භාවිත කිරීමේ වාසි

1) වෙනත් ආකාරයේ මුදල් හා සසඳන විට වඩා කාර්යක්ෂම වීම.

2) භෞතික මුදල්වලට සාපේක්ෂව ආරක්ෂාකාරී වීම (අඩු අවදානම).

3) පහසුවෙන් හා ඉක්මනින් ගෙවීම් කිරීමට හැකි වීම සහ කාලය ඉතිරි වීම.

4) මෙම මුදල් ලොව පුරා ජාත්‍යන්තර ගනුදෙනු සඳහා භාවිත කළ වීම.

5) ඉහළ සමාජ පිළිගැනීම.

*(ලකුණු 03)*

### (c) ප්‍රමාණාත්මක පාලනයන්

1) **විවෘත/විවට වෙළෙඳපොළ කටයුතු**

විවෘත වෙළෙඳපොළ තුළ මහ බැංකුව විසින් සුරැකුම්පත් මිලදී ගැනීම සහ විකිණීම මගින් මුදල් සැපයුම ප්‍රසාරණය කිරීම හෝ සංකෝචනය කිරීම විවට වෙළෙඳපොළ කටයුතු ලෙස හැඳින්වේ. මූල්‍ය පද්ධතියේ අතිරික්ත ද්‍රවශීලතාවයක් පවතින විට, මහ බැංකුව ප්‍රාථමික අලෙවිකරුවන්ට සහ වාණිජ බැංකුවලට සුරැකුම්පත් විකුණයි, එහි ප්‍රතිඵලයක් ලෙස අතිරික්ත ද්‍රවශීලතාව මහ බැංකුවට ගලා යයි. අනෙක් අතට, ද්‍රවශීලතාවය ප්‍රසාරණය කිරීම සඳහා සුරැකුම්පත් විකුණනු ලැබේ.

2) **මහ බැංකු පොළී අනුපාතිකය**

මහ බැංකුව විසින් අවසාන ණය දෙන්නා වශයෙන් ද්‍රවශීලතා ගැටලුවලට මුහුණ දී සිටින වාණිජ බැංකු වෙතින් අය කරනු ලබන පොළී අනුපාතය මහ බැංකු පොළී අනුපාතය යි. බැංකු අනුපාතිකයේ වෙනස්වීම් හරහා වාණිජ බැංකු විසින් ණය නිර්මාණය කිරීමට මහ බැංකුවට බලපෑම් කළ හැකිය. මහ බැංකු පොළී අනුපාතිකය වැඩි වුවහොත් පොළී අනුපාත ඉහළ යාම හේතුවෙන් වාණිජ බැංකුද ණය පොළී අනුපාතිකය වැඩි කරයි. මේ නිසා ණය සඳහා ඇති ඉල්ලුම අඩු වන අතර මුදල් සැපයුම ද සංකෝචනය වේ. පොළී අනුපාතය අඩු වූ විට ඊට ප්‍රතිවිරුද්ධ ප්‍රතිවිපාකය ඇති වේ.

3) **ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය**

මහ බැංකුවේ නියමයන්ට අනුකූලව වාණිජ බැංකු විසින් තම තැන්පතු ප්‍රමාණයෙන් යම් ප්‍රතිශතයක් අතැති මුදල් හා බැංකු මුදල් ලෙස ළඟ තබාගැනීම ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ලෙස හඳුන්වයි. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය වැඩිවීම හෝ අඩුවීම මගින් මුදල් සැපයුමේ ප්‍රසාරණයක් හෝ සංකෝචනයක් ඇති කරයි.

*(ලකුණු 04)*
*(මුළු ලකුණු 10 යි)*

## *පස්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

***පරිච්ඡේදය 06 - අන්තර්ජාතික වෙළෙඳාම සහ විදේශ විනිමය වෙළෙඳපොළ***

**(a) වෙළෙඳ අනුපාතය**

වෙළෙඳ අනුපාතය යනු එක් රටක නිෂ්පාදනයක් වෙනත් රටක නිෂ්පාදනයක් සමග හුවමාරු වන අනුපාතයයි. එය එක් අපනයන ඒකකයක් සඳහා මිලදී ගත් ආනයන ප්‍රමාණයයි. වෙළෙඳ අනුපාතය ආනයන මිල සහ අපනයන මිල අනුව තීරණය වේ.

$$\text{වෙළෙඳ අනුපාතය} = \frac{\text{අපනයන මිල දර්ශකය}}{\text{ආනයන මිල දර්ශකය}} \times 100$$

*(ලකුණු 03)*

**(b)**

නිරපේක්ෂ වාසිය න්‍යාය යනු යම් රටක් වෙනත් රටකට සාපේක්ෂව අඩුම පිරිවැයකින් හෝ ඉහළම කාර්යක්ෂමතාවයකින් භාණ්ඩයක් හෝ සේවාවක් නිෂ්පාදනය කර එම භාණ්ඩ වෙනත් භාණ්ඩයක් සමඟ හුවමාරු කර ගැනීමෙන් වාසියක් ලබා ගැනීමයි.

**උදාහරණ 1:**

ශ්‍රී ලංකාව සහ ඉන්දියාව සමජාතීය යෙදවුම් යොදමින් සහල් නිෂ්පාදනය කරයි. ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ සහල් නිෂ්පාදන පිරිවැය පහත පරිදි වේ.

| රට | කිලෝග්‍රෑමයකට පිරිවැය |
|---|---|
| ඉන්දියාව | රු. 100 |
| ශ්‍රී ලංකාව | රු. 150 |

ඉහත දක්වා ඇති පරිදි එක් එක් රටවල නිෂ්පාදනයේ මිල අනුව **සහල් නිෂ්පාදනයේ නිරපේක්ෂ වාසිය ඉන්දියාවට වන අතර සහල් නිෂ්පාදනයේ නිරපේක්ෂ අවාසිය ශ්‍රී ලංකාවට ඇත.**

**උදාහරණ 2:**

ශ්‍රී ලංකාව සහ චීනය විසින් එක් ශ්‍රම ඒකකයකින් නිෂ්පාදනය කළ හැකි සහල් සහ ද්‍රව්‍ය ඒකක ප්‍රමාණය පහත පරිදි වේ.

| රට | ද්‍රව්‍ය | සහල් |
|---|---|---|
| ශ්‍රී ලංකාව | 8 | 5 |
| චීනය | 4 | 7 |

ද්‍රව්‍ය නිෂ්පාදනයේදී චීනයට වඩා ශ්‍රී ලංකාවට නිරපේක්ෂ වාසියක් ඇත. සහල් නිෂ්පාදනයේදී ශ්‍රී ලංකාවට වඩා චීනයට නිරපේක්ෂ වාසියක් ඇත.

*(ලකුණු 04)*

**(c)**

ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමේ බලපෑම අවම කිරීම සඳහා පහත ක්‍රියාමාර්ග භාවිත කළ හැක.

1) අපනයන දිරිමත් කිරීමට සහ අපනයන තරගකාරිත්වය වැඩි කිරීමට උපාය මාර්ග අනුගමනය කිරීම.

2) ආනයන වියදම් අඩු කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

උදා: අත්‍යවශ්‍ය නොවන ආනයනයන් අධෛර්යමත් කිරීම.

3) අභ්‍යන්තර සමතුලිතතාවය රැක ගැනීමට අවශ්‍ය සම්පත් යෙදවෙන ආකාරයටම බාහිර සමතුලිතතාවය ආරක්ෂා කිරීමට කටයුතු කිරීම.

4) මූල්‍ය ප්‍රතිපත්ති බාහිර සාධකවල බලපෑමකින් තොරව නිදහසේ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

5) ආනයන ආදේශකයක් ලෙස රටේ දේශීය නිෂ්පාදනය දිරිමත් කිරීම.

උදා: දේශීය නිෂ්පාදකයින්ට සහනාධාර ලබා දීම.

*(ලකුණු 03)*

*(මුළු ලකුණු 10 යි)*

***B කොටසෙහි අවසානය***

aat SRI LANKA

## හයවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

**පරිච්ඡේදය 04 - ජාතික ගිණුම්කරණය හා රජයේ කාර්යභාරය**

**(A)**

**(a)**

| | අයිතමය | රු. මිලියන |
|---|---|---|
| | පෞද්ගලික පරිභෝජන වියදම | 7,500 |
| | රජයේ පරිභෝජන වියදම | 2,400 |
| | දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | **800** |
| **(i)** | **වෙළෙඳපොළ මිලට දළ දේශීය වියදම (GDE)** | **10,700** |

*(ලකුණු 04)*

| | | රු. මිලියන |
|---|---|---|
| | **වෙළෙඳපොළ මිලට දළ දේශීය වියදම** | **10,700** |
| | එකතු කලා : අපනයන | 1,300 |
| | අඩු කලා : ආනයන | (2,000) |
| **(ii)** | **වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය (GDP)** | **10,000** |

*(ලකුණු 03)*

| | | රු. මිලියන |
|---|---|---|
| | **වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය** | **10,000** |
| | එකතු කලා : විදේශ ශුද්ධ සාධක ආදායම | (600) |
| | | |
| **(iii)** | **වෙළෙඳපොළ මිලට දළ ජාතික ආදායම (GNI)** | **9,400** |

*(ලකුණු 02)*

SRI LANKA

**(b)**

1) නොවිධිමත් ආර්ථිකය තුළ සිදුවන ඵලදායි නිෂ්පාදන ඇතුළත් නොවීම.

2) යැපුම් ආර්ථික කටයුතු ජාතික නිෂ්පාදිතයට ඇතුළත් නොවීම.

3) ගෘහනියන්ගේ සේවය ජාතික නිෂ්පාදිතයට ඇතුළත් නොවීම.

4) රාජ්‍ය ණය පොළී ජාතික නිෂ්පාදිතය ගණනය කිරීමට දායක කර නොගැනීම.

5) නිෂ්පාදන ක්‍රියාකාරකම් හේතුවෙන් පරිසරයට සිදුවන හානිය සැලකිල්ලට නොගැනීම.

6) රාජ්‍ය සේවාවන්හි ඵලදායිතාවයේ ඇති වන වෙනස් වීම සැලකිල්ලට නොගැනීම.

7) යුද හා ආරක්ෂණ කටයුතු සඳහා දරන වියදම් ඵලදායි නිෂ්පාදනයක් ලෙස සැලකිම.

8) ඇතැම් කල්පවත්නා පාරිභෝගික භාණ්ඩ ආයෝජනයක් ලෙස සලකා ජාතික නිෂ්පාදිතයට ඇතුළත් නොකිරීම.

*(ලකුණු 02)*

### පරිච්ඡේදය 07 - ආර්ථික වර්ධනය, සංවර්ධනය හා ආර්ථිකයේ නව ප්‍රවණතා

**(B) රටකට සෘණ ආර්ථික වර්ධනයක් පැවතීමෙන් ඇති විය හැකි ප්‍රතිවිපාක**

1) රටේ සැබෑ ජාතික නිෂ්පාදිතය අඩුවීම.

2) මිනිසුන්ගේ ජීවන තත්ත්වය පහත වැටීම.

3) ආර්ථිකයේ මුදල් අවප්‍රමාණය වීම.

4) ආර්ථිකයේ උද්ධමනය වැඩි වීම.

5) පුළුල් ආදායම් විෂමතා මතුවීම.

6) කලාපීය විෂමතා මතුවීම.

7) වත්මන් පරිභෝජන මට්ටම වැඩි වීම.

8) පරිසරයට අහිතකර බලපෑම් ඇති වීම.

9) සැබෑ ආදායම අඩුවීම.

10) විරැකියාව ඉහළ යාම.

11) රටේ ණය බර වැඩි වීම සහ වෙනත් රටවලින් අමතර ණය ලබා ගැනීමට අපහසු වීම.

12) නිෂ්පාදනය අඩු වීම.

13) සමාජ ගැටලුවල අහිතකර බලපෑම්.

*(ලකුණු 03)*

### පරිච්ඡේදය 04 - ජාතික ගිණුම්කරණය හා රජයේ කාර්යභාරය

**(C) සාර්ව ආර්ථික අරමුණු**

**1) මිල ස්ථායීතාවය**

උද්ධමනයක් හෝ අවධමනයකින් තොරව ආර්ථිකය ස්ථාවරව පවත්වාගෙන යාම මිල ස්ථායිතාව ලෙස හැඳින්වේ. එනම් අවම උද්ධමන අනුපාතිකයක් යටතේ ආර්ථිකය පවත්වාගෙන යාමයි.

**2) පූර්ණ සේවා නියුක්තිය**

ආර්ථිකයේ ඇති සියලුම සම්පත් පූර්ණ හා උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව නිෂ්පාදන කටයුතු සඳහා උපයෝජනය කිරීම පූර්ණ සේවා නියුක්තිය ලෙස අදහස් වේ. සේවා වියුක්තිය අවම කර ගැනීම තුළින් ඉහළ සේවා නියුක්තියක් අත්කර ගැනීම එමඟින් අපේක්ෂා කෙරේ.

**3) ගෙවුම් ශේෂ සමතුලිතතාවය (BOP)**

ගෙවුම් ශේෂ සමතුලිතතාවය සාක්ෂාත් කර ගැනීම සඳහා විදේශ රටවල් සමග ගනුදෙනු සිදු කරන විට ගෙවුම් ශේෂ අර්බුදයකින් තොරව ආර්ථිකය කළමනාකරණය කිරීම වැදගත් වේ.

**4) සාධාරණ ආදායම් ව්‍යාප්තිය**

රටක ජනගහනය අතර සාධාරණව ආදායම් බෙදීයාම සහතික කිරීම මගින් රටකට සමානාත්මතාවය ළඟා කර ගැනීමට හැකි වේ. රටක සෑම පුරවැසියෙකුටම ඔහුගේ/ඇයගේ අවශ්‍යතා සපුරාලීමට හැකියාව වන බව සහතික වන ආකාරයෙන් ආදායම සහ ධනය බෙදී යා යුතුය.

SRI LANKA

**5) තිරසාර සංවර්ධනය**

පරිසරයේ ගුණාත්මක බව ආරක්ෂා කරමින් නිෂ්පාදන ඉහළ නැංවීම සහ සංවර්ධනයේ ප්‍රතිලාභ ජනතාව අතර බෙදාහැරීම සහතික කිරීම තුළින් රටක් තිරසාර සංවර්ධනයක් අත්කර ගැනීමට සමත් වේ. පාරිසරික, ආර්ථිකය හා සමාජයීය යන සියලුම අංශයන්හි තුලනාත්මක වර්ධනයක් ඇති කරලීමයි.

**6) ආර්ථික වර්ධනය**

රටක මූර්ත දළ ජාතික නිෂ්පාදිතය අඛණ්ඩව ඉහළ යාම ආර්ථික වර්ධනය ලෙස අදහස් කෙරේ.

*(ලකුණු 06)*

*(මුළු ලකුණු 20 යි)*

aat SRI LANKA

***C* කොටසෙහි අවසානය**

## *Notice:*

These answers compiled and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.

These should be understood as Suggested Answers to questions set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers". The fundamental objective of this publication is to add completeness to its series of study texts, design especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well and stay relevant in the art of answering questions at examination level.

SRI LANKA

*© 2021 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka). All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*